සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	වාණිජ කටයුතු හා ව්‍යවසායකත්වය I, II	කාලය / நேரம் / Time: පැය 3 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි. අමතර කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ලිවීමේදී ප්‍රමුකත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

වාණිජ කටයුතු හා ව්‍යවසායකත්වය I

උපදෙස් -

- සියළු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (X) ලකුණ යොදන්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 1- 6 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ලෝක ළමා දිනය නිමිත්තෙන් අඹ ගහ තැන්න කණිෂ්ඨ විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය සිසු දරුවන් සඳහා සපත්තු මේස් සහ පාසල්උපකරණ කට්ටලයක් ඇතුලත් පොත් බෑග් බෙදා දීමේ උත්සවයක් සංවිධානය කෙරිණි.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම මත සී/ ස බෙස්ට් වෙයා සමාගමේ අධිපති අසංග මහතා ද නිර්මාණී බෑග් නිෂ්පාදකයින් වන නිර්මාණී මහත්මිය ද වන්දන බුක් ෂොප් හිමිකරු වන්දන මහතා ද මෙයට දායකත්වය දක්වන ලදි.

1. ඉහත සිද්ධියේ ඇතුලත් මූලික මිනිස් අවශ්‍යතා වන්නේ,
   (1) ඇදුම්
   (2) සපත්තු ,මේස්,බෑග්
   (3) අධ්‍යාපනය
   (4) ඇදුම් හා අධ්‍යාපනය

2. අඹගහ තැන්න කණිෂ්ඨ විද්‍යාලයේ අභ්‍යන්තර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වන්නේ,
   (1) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
   (2) සී.ස. බෙස්ට් වෙයා සපත්තු සමාගම
   (3) අඹ ගහ තැන්න කණිෂ්ඨ විද්‍යාලයේ සිසු දරුවන්
   (4) බෑග් නිෂ්පාදකයින් වන නිර්මාණී මහත්මිය

3. ඉහත සිද්ධියේ ඇතුලත් ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයක් වන්නේ,
   (1) නිර්මාණී බෑග් නිෂ්පාදකයින්
   (2) සී.ස. බෙස්ට් වෙයා සපත්තු සමාගම
   (3) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
   (4) වන්දන බුක් ෂොප්

Past Papers Wiki

4. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
   (1) නිෂ්පාදන ව්‍යාපාර සංවිධානයකි.
   (2) සේවා සැපයුම් ව්‍යාපාර සංවිධානයකි
   (3) ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර සංවිධානයකි
   (4) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි

5. සිද්ධියට අදාලව නීතිමය පුද්ගල භාවයක් සහිත ව්‍යාපාර සංවිධානයක් වනුයේ,
   (1) වන්දන බුක් ෂොප්
   (2) නිර්මාණී බෑග් නිෂ්පාදකයින්
   (3) සී.ස. බෙස්ට් වෙයා සපත්තු සමාගම
   (4) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

6. නිර්මාණී බෑග් නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන ව්‍යවසායකත්වය සඳහා උදාහරණයක් වන්නේ,
   (1) බෑග් නිෂ්පාදනය සඳහා භාවිතා කරන රෙදි
   (2) කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල
   (3) බෑග් නිෂ්පාදන ආයතනයේ සේවකයින්.
   (4) බෑග් නිෂ්පාදන ආයතනය සතු ව්‍යාපාරික හැකියා.

7. ඇල්මැති පාර්ශවයන් x තීරුවේද ඔවුන්ගේ දායකත්වයන් y තීරුවේ ද දැක්වේ.

ඇල්මැති පාර්ශවයන්	දායකත්වය
1.අයිතිකරුවන්	A.ව්‍යාපාර සැළසුම් නිසි ලෙස ක්‍රියාය නැංවීම
2. කළමනාකරුවන්	B.පවරන ලද කාර්යය නිසි ලෙස ඉටු කිරීම
3. සේවකයින්	C.ව්‍යාපාර කටයුතු වල උනන්දුව හා කැප වීම
4. සැපයුම්කරුවන්	D.ගුණාත්මක අමුද්‍රව්‍ය සැපයීම

   ඉහත x හා y කරුණු පිළිවෙළින් ගැලපූ විට,
   (1) 1 C, 2 B, 3 A, 4B
   (2) 1 D, 2 C, 3 A, 4B
   (3) 1 C, 2 A, 3 B , 4D
   (4) 1 D , 2 B , 3A, 4C

8. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම ක් වන්නේ,
   (1) පුහුණු ශ්‍රමිකයන් විදේශ රටවලට ගලා යෑම
   (2) දැඩි තරගකාරීත්වයකට මුහුණ දීම
   (3) දේශීය ව්‍යාපාර වල පැවැත්ම ස්ථාවර වීම
   (4) නවීන තාක්ෂණය ලබා ගත හැකි වීම

9. පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසර සාධක කිහිපයකි.
   A.නව යන්ත්‍ර සූත්‍ර සොයා ගැනීම
   B.රටක යටිතල පහසුකම් සංවර්ධනය වීම
   C.පොළී අනුපාතය
   D.ජාත්‍යන්තර සබඳතා

   ඉහත සාධක අතුරින් ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,
   (1) Aහා C (3) C හා B
   (2) Cහා D (4) A හා D

10. විද්‍යුත් තැපෑල , පරිගණක හා තොරතුරු පද්ධති , පරිගණක ගත කළ යන්ත්‍ර සූත්‍ර ආදිය ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අදාල වන පරිසර සාධකය වන්නේ,
(1) ගෝලීය පරිසරය (3) ආර්ථික පරිසරය
(2) තාක්ෂණික පරිසරය (4) දේශපාලන පරිසරය

11. ව්‍යාපාරයක භාහිර පරිසරය අධ්‍යනය තුළින් හඳුනාගත හැකි අවස්ථාවක් හා අභ්‍යන්තර පරිසරය අධ්‍යනය තුළින් හඳුනාගත හැකි ශක්තියක් පිළිවෙළින් දැක්වෙන්නේ,
(1) අඩු පොළී ණය ක්‍රම, සුවිශේෂී නිෂ්පාදන ක්‍රම
(2) අධිවේගී මාර්ග ඉදි කිරීම,සේවකයින්ගේ අයහපත් ආකල්ප
(3) ව්‍යාපාරවලට හිතකර නීති රීති,ස්වාභාවික ආපදා
(4) මූල්‍ය ශක්තිය,කලමනාකරුවන්ගේ අත්දැකීම්

12. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයකි.
(1) සී/ස සුලලිත සමාගම (3) සැම්සන් සහ පුත්‍රයෝ
(2) ලංකා සතොස (4) සදමිණි ස්ටෝර්ස්

13. ඒක පුද්ගල ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක දැකිය හැකි අවාසි වන්නේ,
(1) අසීමිත වගකීම හා අඛණ්ඩ පැවැත්ම
(2) ලාභය හවුල්කරුවන් අතර බෙදීයාමේ දී හවුල් කරුවන් අතර මතභේද ඇතිවීම
(3) ව්‍යාපාරයට නෛතික පුද්ගල භාවයක් හිමි නොවීම
(4) ලියා පදිංචිය අනිවාර්‍ය නොවීම

14. සී/ස සමාගමක් ලියා පදිංචි කිරීමේ පනත වන්නේ,
(1) 2007 අංක 07 දරණ සමාගම් පනත
(2) වංචා වැළැක්වීමේ ආඥා පනත
(3) ව්‍යාපාර නාම ආඥා පනත
(4) 2007 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

15. හවුල් ඔප්පුව යන්නෙන් අදහස් වන්නේ,
(1) වාචිකව හවුල්කරුවන් අතර ඇතිකර ගන්නා එකගතාවය
(2) ව්‍යංගයෙන් හවුල්කරුවන් අතර ඇති තර ගන්නා එකගතාවය
(3) ලිඛිතව හවුල්කරුවන් අතර ඇති තර ගන්නා එකගතාවය
(4) හවුල් කරුවන් අතර ඇතිවන ගැටළු විසඳාගැනීමේ එකගතාවය

16. ප්‍රජාතන්ත්‍රීයව පාලනය වන ස්වේච්ඡාවෙන් එකට එකතු වී සාමූහික අයිතියක් භුක්ති විඳින ස්වායත්ත සංවිධානයක් වන්නේ,
(1) කේවල ස්වාමී ව්‍යාපාර (3) රාජ්‍ය සජස්ථා
(2) සමිති සංවිධානයි (4) සමූපකාර සමිති

17. ගිණුම්කරණයේ අරමුණක් වන්නේ,
(1) ව්‍යාපාරයක් දීර්ඝකාලයක් පවත්වා ගැනීමයි
(2) ගනුදෙනු මූලික සටහන්පොත්වල සටහන් කිරීමය
(3) ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද යන්න දැන ගැනීම
(4) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමයි

18. පහත සඳහන් ගනුදෙනු හා සිද්ධීන් අතුරින් ව්‍යාපාරික ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැක්කේ,
(1) රු.20000 විදුලි ගාස්තු ගෙවීම (3) රු3000 බොල් ණය ඇති වීම
(2) රු.14000 ක ලීබඩු මිලට ගැනීම (4) රු. 10000 ණය හිමියන්ට ගෙවීම

19. පහත සඳහන් ප්‍රකාශනයේ වත්කම් පමණක් ඇතුලත් ප්‍රකාශය වන්නේ,
(1) මුදල්,බැංකු ණය,ආයෝජන,මෝටර් රථ
(2) ණය ගැතියෝ,තොගය,ගොඩනැගිලි,ලීබඩු හා උපකරණ
(3) ණය හිමියන් ,මෝටර් රථ,බැංකු ශේෂය, මුදල්
(4) තොගය, මෝටර්රථ,ලී බඩු හා උපකරණ,බැංකු ණය

20. ව්‍යාපාරයක මුළු වත්කම් වලින් වගකීම් අඩුකල විට ලැබෙන්නේ,
(1) ආදායමය (3) හිමිකමය
(2) වගකීමය (4) වියදමය

21. වගකීම් හා වත්කම් හඳුනා ගැනීමේ දී යොදා ගන්නා පොදු නිර්නායක වන්නේ,
(1) ආර්ථික ප්‍රතිලාභ අත් කර දීම
(2) වර්ථමාන බැදීමක් තිබීම
(3) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
(4) මුදලින් මැනිය හැකි වීම

22. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් අයිතිකරුගේ හිමිකම ප්‍රකාශ වන වගන්තිය වන්නේ,
(1) අයිතිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය
(2) භාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු වටිනාකමය
(3) වත්කම් වලින් භාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු වටිනාකම
(4) භාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වටිනාකමයි

23. ව්‍යාපාරයේ අයිතිකරු හා භාහිර පාර්ශවයන් ව්‍යාපාරයට මුදල් යොදවා ඇති විට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වන්නේ,
(1) වත්කම් = හිමිකම්- වගකීම්.
(2) වගකීම් = හිමිකම් +වත්කම්
(3) වත්කම් = හිමිකම් + වගකීම්
(4) හිමිකම් = වත්කම් + වගකීම්

24. ගනුදෙනුවක් සිදුවූ පසු එය ගිණුම්කරණ සමීකරණයට බලපාන ලද්දේ පහත සඳහන් පරිදිය.

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
-15000		5000		10000

ඉහත ගිණුම්කරණ සමීකරණයේ සඳහන්ව ඇති ගනුදෙනුව වන්නේ,
(1) බැංකු ණය රු.10000 ක් ගෙවීමය
(2) බැංකු ණය පොළිය රු.5000 සමග ණය වාරිකය රු.15000 ගෙවීමය.
(3) රු.5000 වියදමක් ගෙවීමය
(4) රු.10000ක් ණය හිමියන්ට ගෙවීමය

25. ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයේ හිමිකම වෙනස් වීමට බලපාන ගණුදෙනුවක් වන්නේ,
(1) රු. 25000 බැංකු ණයක් ලබා ගැනීම
(2) රු.15000 භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම
(3) රු.12000 කොමිස් ආදායම් ලැබීම
(4) රු.75000 යන්ත්‍රයක් මිළට ගැනීම

26. ව්‍යාපාරයක වත්කම් සහ වගකීම් යන දෙකම අඩුවන ගනුදෙනුවකි.
(1) රු. 5000 ක ණය මුදලක් ගෙවීම.
(2) ණයගැතියකුගෙන් රු.12000 ලැබීම
(3) රු.5000 දුරකථන බිල ගෙවීම
(4) රු.12000 ගෙවල් කුලී ලැබීම

27. ජානිගේ රෙදිපිළි වෙළඳ ව්‍යාපාරයේ 2023 වර්ෂය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

23.01.01 ප්‍රාග්ධනය රු.200000
වර්ෂයේ ආදායම රු.75000
වර්ෂයේ වියදම රු. 44000
අයිතිකරුගේ රු. 100000 ක් වටිනා බීම සාධන යන්ත්‍රය ව්‍යාපාරයට යොදවන ලදි.
පෞද්ගලික ගැනිලි 20000
2023.12.31 දිනට ජානිගේ හිමිකම වන්නේ,

(1) රු.300000 (2) රු.375000 (3) රු.244000 (4) රු.311000

28. වැඩි වීම **බැර** අඩු වීම **හර** යන ද්විත්ව සටහන් රීතිය අදාල වන ප්‍රකාශනය ලෙස දැක්වෙන්නේ,
(1) ගැනුම් ගිණුම,ලීබඩු ගිණුම,මුදල් ගිණුම
(2) ප්‍රාග්ධන ගිණුම,ලැබූ පොළී ගිණුම, විවිධ වියදම් ගිණුම
(3) ගැනිලි ගිණුම,ප්‍රාග්ධන ගිණුම, ණය පොළී ගිණුම
(4) විකුණුම් ගිණුම,බැංකු ණය ගිණුම, ලැබූ කොමිස් ගිණුම

29. අමතර ප්‍රාග්ධනය රු.100000 යෙදවීම නිසා ගිණුම්කරණ සමීකරනයට ඇතිකරණ ද්විත්ව බලපෑම දැක්වෙන ප්‍රකාශය,
(1) වත්කම් අඩුවේ, හිමිකම් අඩු වේ
(2) වත්කම් වැඩි වේ, හිමිකම් වැඩි වේ.
(3) හිමිකම් වැඩි වේ,වගකීම් අඩුවේ
(4) වගකීම් වැඩි වේ, වත්කම් වැඩි වේ

30. රු.20000 භාණ්ඩ ණයට විනිණීමට අදාල ද්විත්ව සටහන තෝරන්න.

(1) ගැනුම් ගිණුම හර 20000
විකුණුම් ගිණුම 20000
(2) ණය ගැති ගිණුම හර 20000
විකුණුම් ගිණුම 20000
(3) මුදල් ගිණුම හර 20000
විකුණුම් ගිණුම 20000
(4) ණය හිමි ගිණුම හර 20000
ණය ගැති ගිණුම 20000

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක් වේ.ඒ ඇසුරින් 31 ,32 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

A රු. 25000ක් වටිනා භාණ්ඩ තොගයක් ණය ට ගැනීම
B රු.5000 ක් වටිනා උපකරණ අත්පිට ගැනීම

31. A ගනුදෙනුවට අදාල මූලාශ්‍ර ලේඛනය සහ මූලික සටහන් පොත වනුයේ,
(1) ලදුපත, මුදල් පොත
(2) වවුවරය,ජ නලය
(3) විකුණුම් ඉන්වොයිසිය
(4) ගැනුම් ඉන්වොයිසිය,ගැනුම් ජනලය

32. B ගනුදෙනුවට අදාල මූලාශ්‍ර ලේඛනය සහ මූලික සටහන් පොත වනුයේ,
(1) ලදුපත ,මුදල් පොත
(2) වවුවර,මුදල් පොත
(3) ජනල් වවුවරය,ජනලය
(4) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජනලය

33. ජනල් වවුචරය මූලාශ්‍ර ලේඛනයක් ලෙස භාවිතා කරන ගනුදෙනුව,
(1) රු.100000 ක උපකරණ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ණයට ගැනීම
(2) රු.5000 වටිනා ලී බඩු අත්පිට මුදලට ගැනීම
(3) විකිණීම සඳහා රු.90000 භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
(4) රු.35000 භාණ්ඩ තොගයක් ණයට විකිණීම

34. ද්විත්ව කාර්යයක් ඉටු කරනු ලබන මූලික පොත් යුගලය ලෙස දැක්වෙන්නේ,
(1)මුදල් පොත, ගැනුම් ජනලය
(2.)මුදල් පොත, සුළු මුදල් පොත
(3) විකුණුම් ජනලය,ගැණුම් ජනලය.
(4) පොදු ජනලය,ගැනුම් ජනලය.

35. ව්‍යාපාරයක මුදල් වට්ටම් ඇති වන අවස්ථාවක් වන්නේ,
(1) භාණ්ඩ ණයට විකිණීමේ දිය
(2) භාණ්ඩ ණයට ගැනීමේ දිය
(3) අත්පිට මුදලට විකිණීමේ දිය
(4) ණය ගැතියන් මුදල් බෙරුම් කිරීමේ දිය

36. මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරු වල එකතුව
(1) ලද වට්ටම් ගිණුමට හර කරනු ලැබේ
(2) දුන් වට්ටම් ගිණුමට හර කරනු ලැබේ
(3) දුන් වට්ටම් ගිණුමට බැර කරනු ලැබේ
(4) ලද වට්ටම් ගිණුමට බැර කරනු ලැබේ

37. ණය හිමියන් ට රු. 60000 ණය පියවීමේ දී 4% වට්ටමක් ලැබුන අතර එම ලද වට්ටමට අදාල ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් පොත	හර	2400	
ලද වට්ටම් ගිණුම			2400
(2) ලද වට්ටම් ගිණුම	හර	2400	
මුදල් පොත			2400
(3) ණය හිමි ගිණුම	හර	2400	
ලද වට්ටම් ගිණුම			2400
(4) දුන් වට්ටම් ගිණුම	හර	2400	
මුදල් පොත			2400

38. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය යනුවෙන් අදහස් කරන්නේ,
(1) කාලදර්ශේදය ට අදාල මුදල ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරුට ලබා දීම
(2) සුළු මුදල් භාරකරු ඉල්ලුම් කරන මුදල ලබා දීම
(3) සුළු මුදල් භාර කරු සතුව ඇති ඉතිරි මුදලට සමාන මුදලක් ලබා දීමය
(4) කාලද්ජේදය තුළ සුළු මුදල් භාරකරු වියදම් කළ මුදල ට සමාන මුදලක් ලබා දීමයි.

පහත සඳහන් තොරතුරු ඇසුරින් 39 හා 40 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2024.01.01. සුළු මුදල් ශේෂය රු.200

2024.01.01. අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම 2800

39. මෙම ව්‍යාපාරයේ දෙසැම්බර් මාසයේ සුළු මුදල් වියදමේ වටිනාකම,
(1) රු.2800 (2) රු. 3000 (3) රු.2600 (4) රු.200

40. මෙම ව්‍යාපාරයේ ජනවාරී මාසයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම,
(1) රු.3000 (2) රු.2800 (3) රු.200 (4) රු.2600

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade	කාලය / நேரம் / Time
10 ශ්‍රේණිය	

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

උපදෙස් - පළමුවන ප්‍රශ්නය ඇතුළුව **I** කොටසින් **ප්‍රශ්න දෙකක් ද II** කොටසින් **ප්‍රශ්න දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. අ.පො.ස. උ.පෙළ වාණිජ විෂය ධාරාවෙන් අධ්‍යයනය ලැබූ මාධවී ගෙවතු අළංකරණය පිළිබඳව පාඨමාලාවක් හදාරන ලදී. පාඨමාලාව අවසන් කළ ඇය ගෙවතු අලංකරණය කර දීම සඳහා **විසිතුරු උයන** නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

2024.01.01 දින තමා ඉතිරි කරගත් මුදල් රු.100000ක්ද රු. 300000ක් වටිනා තමාගේ කුඩා ගොඩනැගිල්ලක්ද ව්‍යාපාරය සඳහා යොදවන ලදී .මෙදින රු. 200000 බැංකු ණයක්ද ලබාගන්නා ලදී.ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය රු.200000ක උපකරණද මෙදිනම මිලදී ගනනා ලදී .

2024 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

තණකොළ පිඬැලි මිලදී ගැනීම	රු. 16000
මල් පෝච්චි මිලදී ගැනීම	රු. 22000
අලංකාර මල් පැල මිලදී ගැනීම	රු. 8000
දුරකථන වියදම්	රු. 2500
විසිතුරු මත්ස්‍ය ආහාර සඳහා	රු. 6000
අලංකරණ මල් පැළ අලෙවි ආදායම	රු. 32000
ගෙවතු අලංකරණය තුලින් ලැබූ සේවා ආදායම	රු. 60000

2024.01.15 වන දින ව්‍යාපාරයේ කටයුතු වල පහසුව සඳහා ඇයගේ යෙහෙළිය වූ තමාලී රු.200000ක ප්‍රාග්ධනයක් සමග ව්‍යාපාරයට සම්බන්ධ කර ගන්නා ලදී.

i. (අ) මෙම ව්‍යාපාරය විසින් ඉටු කරනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?
(ආ) මෙම ව්‍යාපාරය සාර්ථක වීමට බලපාන ලද ශක්තීන් දෙකක් ලියන්න.

ii. (අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව ඉහත ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකටද?
(ආ) ඉහත ව්‍යාපාරයේ දැකිය හැකි නිෂ්පාදන සාධක 02 නම් කරන්න- උදාහරණ දක්වන්න .

iii. (අ) 2004.01.15 දින තම යෙහෙළිය සම්බන්ධ කර ගැනීමෙන් පසු ආරම්භ කරන ලද ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? එහි වාසි 02 ලියන්න.
(ආ) එම ව්‍යාපාර සංවිධානය අර්බුද වලින් තොරව පවත්වාගෙන යාමට අනුගමනය කළ යුත්තේ කුමක්ද?

iv) (අ) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.
(ආ) ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

v) ඉහත සිද්ධියෙහි ඇතුළත් මූලික සටහන් පොතක් සහ මූලාශ්‍ර ලේඛනයක් නම් කරන්න.

vi) 2024 .01.01 දිනට ගිණුම්කරණ සමීකරණ දක්වන්න

vii) මෙම ව්‍යාපාරයේ 2024 .12.31.දිනට මුදල් ශේෂය කොපමණද?

viii) බැංකු ණය ගැනීම සම්බන්ධ ද්විත්ව සටහන ලියා දක්වන්න.

ix) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම වත්කමක් හා ජංගම නොවන වත්කමක් වටිනාකම් සහිතව ලියා දක්වන්න.

x) ඉහත සිද්ධියට අදාළව හිමිකම් වෙනස් වීමට බලපාන ගනුදෙනු දෙකක් ලියා දක්වන්න. (ල.20)

1.කොටස- ව්‍යාපාර අධ්‍යනය
ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

2.(i) ව්‍යාපාරයක පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණු දෙකක් නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) ව්‍යාපාරිකයින් ට නිර්මාණය කළ හැක්කේ වුවමනා නොව අවශ්‍යතාවයන්ය.
(ආ) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුෂ්කරතා නිසා අද පවතින මුදල් හුවමාරු ක්‍රමය ඇති වේ.
(ඉ) භාණ්ඩ හා සේවා නිශ්පාදනයට අවශ්‍ය සම්පත් නිශ්පාදන සාධක ලෙස හඳුන්වනු ලැබේ.
(ඊ) ව්‍යාපාර සඳහා හිතකර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම රජය මගින් ව්‍යාපාර සඳහා කරන දායකත්වයකි (ල.02)

(iii) පාසල් ගුරුවරයකු වූ සම්පත් අසනීප වීම නිසා තමා එදිනට පාසල් ඒමට නොහැකි බව දන්වා විදුහල්පතිතුමාට SMS පණිවුඩයක් යවන ලදි.පණිවුඩය යැවීමට තමාගේ නවීන ස්මාර්ට් දුරකථනය භාවිතා කරන ලදි.
(අ) ඉහත සිද්ධියේ සඳහන් අවශ්‍යතාවයක් හා වුවමනාවක් සඳහන් කරන්න.
(ආ) නවීන ස්මාර්ට් දුරකථනය අයත් වන්නේ කිනම් ව්‍යාපාර පරිසර සාධකයටද? (ල.02)

(iv) කලාප අධ්‍යාපන කාර්යාලයේ ආපන ශාලාව පවත්වා ගෙන යන රංගිකා ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ඖෂධ කොළ වර්ග වලින් කොළ කැද සකසා අලෙවි කරයි. කලාප කාර්යාලයට පැමිණෙන නිළධාරීන් , කාර්යාලයීය සේවකයින් කොළ කැද පානය පුරුද්දක් කරගෙන සිටී.
(අ) සිද්ධියට අදාලව නිශ්පාදන සාධක 02 ක් උදාහරණ සහිතව දක්වන්න. (ල.01)
(ආ) මෙහි සඳහන් ඇල්මැති පාර්ශවයන් 02 උදාහරණ සහිතව දක්වන්න (ල.01)

3.(i) ව්‍යාපාර පරිසරය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) රටක රජය විසින් අනුගමනය කරන අයවැය ප්‍රතිපත්ති දේශපාලන පරිසරයට අයත් වේ.
(ආ) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව සෑම විටම භාහිර පරිසරයට අයත් වේ.
(ඉ) භාණ්ඩ හා සේවාවල මිළ ගණන් අඛණ්ඩව ඉහළ යෑම උද්ධමනය ලෙස හැදින්වේ.
(ඊ) ව්‍යාපාරයක් නව තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගැනීම ව්‍යාපාරයට තර්ජනයකි. (ල.02)

(iii) දිවයින පුරා අන්තර්ජාල පහසුකම් ව්‍යාප්තියත් සමග අවකාශ වෙළඳපල බිහිවිය.මේ නිසා මාර්ග ගත ක්‍රමයට භාණ්ඩ ගෙන්වා ගැනීමට හැකිවිය.
(අ) අන්තර්ජාල පහසුකම් ව්‍යාප්ත වීම කුමන පරිසර සාධකයකට අයත්ද?
(ආ) එම පරිසර සාධකය නිසා ඇතිවිය හැකි හිතකර අහිතකර බලපෑම් 01 බැගින් ලියන්න. (ල.02)

(iv) නෙත්මී සෙල්ලම් බඩු නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යයි.සුවිශේෂී නිෂ්පාදන ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සෙල්ලම් බඩු නිෂ්පාදනය කිරීම නිසා දේශීය වෙළඳපලේ ඇයගේ නිෂ්පාදන සඳහා හොඳ ඉල්ලුමක් පවතී.රජය විසින් මෑත කාලයේ දී විදේශීය රටවලින් අත්‍යාවශ්‍ය නොවන ද්‍රව්‍ය ආනයනය ද තහනම් කර ඇත.
(අ) නෙත්මීගේ ව්‍යාපාරයට ලැබී ඇති ශක්තියක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරයට ලැබී ඇති අවස්ථාවක් නම් කරන්න. (ල.02)

4. (i) ඒක පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි අවාසි 02 නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) සෑම ව්‍යාපාරයක් ම ලියා පදිංචි කිරීමෙන් නෛතික පුද්ගල භාවයක් හිමිවේ.
(ආ) හවුල් ව්‍යාපාරයක් අනිවාර්යයෙන්ම ලිඛිත ගිවිසුමක් අනුව පවත්වා ගත යුතුය.
(ඉ) සමූපාකාර සමිති නීතිමය පුද්ගල භාවයක් ඇති ව්‍යාපාර සංවිධානයකි.
(ඊ) දෙපාර්තමේන්තු වලට අරමුදල් සපයනු ලබන්නේඅයවැය ලේඛනයක් මගිනි. (ල.02)

PAST PAPERS WIKI

(iii) සී/ස දිවිතුරුවෙළ වැවිලි සමාගම , දිවිතුරුවෙළ තේ වගා කරුවන්ගේ සමිතිය හා මහජන බැංකුව සමග ඒකා බද්ධ වී තේ වගා කරුවන් සඳහා ණය යෝජනා ක්‍රමයක් අරඹන ලදි.තේ වගා කරුවන්ගේ ආර්ථිකය ස්ථාපිත කිරීම මෙහි අරමුණ විය.
(අ) මෙහි සඳහන් නීතිමය පුද්ගල භාවයක් සහිත ව්‍යාපාර සංවිධාන 2 නම් කරන්න.
(ආ) ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාර සංවිධාන නම් කර ඒවා ඇරඹිය යුතු පනත් නම් කරන්න. (ල.02)

(iv) ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කල යුතු ලිපිලේඛන 2 ක් නම් කරන්න (ල.02)

11 කොටස - ගිණුම්කරණය

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

5. (i) ගිණුම්කරණයේ අවශ්‍යතා දෙකක් ලියන්න (ල.02)

(ii) ව්‍යාපාර ගනුදෙනු නිසා ජනිත වන දෑ මොනවාද? (ල.02)

(iii) පහත දැක්වෙන්නේ නිශාන්ගේ ව්‍යාපාරයගේ 2023 දෙසැම්බර් මස පළමු සතිය තුළ සිදුවූ ගනුදෙනු කිහිපයකි.
(අ) රු.50000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කළා. (ආ) රු.15000 ක භාණ්ඩ මිල දී ගත්තා

(ඇ) රු.25000 ක බැංකු ණයක් ගත්තා.

(ඉ) රු.10000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් 15000ට ණයට වික්කා.

(ඊ) රු.3000 ක විදුලි වියදම් ගෙව්වා.

(අ) ඉහත සඳහන් ගනුදෙනු පහත දක්වා ඇති වගුවේ දැක්වෙන ආකාරයට ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

ගනු දෙනු	වත්කම්	= හිමිකම්	+ වගකීම්
අ	+ 50000 (මුදල්)	+ 50000 (ප්‍රාග්ධනය)	
ආ			
ඇ			
ඉ			
ඊ			

(1x4)= 04

(ආ). ඉහත ගනුදෙනු සිදුවීමෙන් පසු ගිණුම්කරණ සමීකරණය දක්වන්න. (ල.02)

(iv) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.එසේ බලපෑම් ඇති කිරීමට හේතු වූ ගනුදෙනුව බැගින් ලියන්න.

වත්කම් = හිමිකම් + වගකීම්

(අ). අඩුවේ
වැඩිවේ =

(ආ) අඩුවේ = අඩුවේ

(ඇ) වැඩිවේ = + වැඩිවේ

(ඇ) වැඩිවේ = වැඩිවේ (1/2x4=ල.02)

6. පහත සඳහන් ගනුදෙනු ඇතුලත් කිරීමට අවශ්‍ය වන මූලික පොත් හා මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

(i)

ගනුදෙනුව	මූලික සටහන් පොත	මූලාශ්‍ර ලේඛනය
A ප්‍රාග්ධනය යෙදවීම රු.100000		
B ණයට ගැනුම් රු.25000		
C කාර්යාල උපකරණ ණයට ගත්තා රු.25000		
D ණයට විකුණුම් රු.75000		

(ල.1*4=4)

- සනාල්ගේ ව්‍යාපාරය 2024.06.01 දින භාන්ඩ තොගයක් රු.20000 මිළට ගත් අතර එදිනම ව්‍යාපාරයේ ප්‍රයෝජනය ට කාර්යාල පුටු දෙකක් ජයරාණි ලීබඩු වෙළඳ සැලෙන් ණයට ගන්නා ලදි.

(ii) (අ) ව්‍යාපාරයක ගනුදෙනු වර්ග දෙකක් හඳුනා ගත හැකිය.එම ගනුදෙනු වර්ග දෙක දක්වන්න.
(ආ) එම ගනුදෙනු දෙකට අදාල නිදසුන් ඉහත සිද්ධියෙන් ලියා දක්වන්න. (ල.01*2=2)

(iii) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකි.
ප්‍රාග්ධනය යෙදුවා රු.50000
අයිතිකරුගේ ගැනිලි රු.5000
විදුලි බිල ගෙව්වා රු. 3000
(අ) ඉහත සඳහන් ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ගිණුම් මොනවාද? (ල.02)
(ආ) ඉහත දැක්වූ ගිණුම් අයත්වන ගිණුම් වර්ග මොනවාද? (ල.02)

(iv) ව්‍යාපාරයක සිදුවන සම්පත් හුවමාරුව ගනුදෙනුවක් ලෙස සැලකේ.මීට අමතරව ව්‍යාපාරය තුළ සිදු වූ ඇතැම් සිද්ධි ද ගිණුම්කරණයේ දී ගනුදෙනු ලෙස සලකයි.මෙවැනි සිදු වීම් දෙකක් සඳහා උදාහරණ සපයන්න. (ල.02)

7. (i). (අ) මුදල් වට්ටම් යනු කුමක්ද?

(ආ) දුන් වට්ටම් වලට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල.02)

(ii) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණ කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.02)

(iii) චතුරිකාගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයේ සිදුවූ පහත සඳහන් ගනුදෙනු මුදල් පොතක සටහන්කර තුලනයකරන්න

24/01/01	ශේෂය රුපියල් 24000	
24/01/02	අත් පිට විකුණුම් රු.48000 ලදුපත් අංක	01
24/01/03	ලද කොමිස් ආදායම රු.18000 ලදුපත් අංක	02
24/01/04	අත් පිට ගැණුම් රු.15000 වවුචර් අංක	01
24/01/05	විවිධ වියදම් රු.6000 වවුචර් අංක	02

(ල.04)

(iv). වරුනිගේ ව්‍යාපාරයේ 2023 දෙසැම්බර් මාසයේ මුල් සතිය තුළ සිදු වූ පහත සඳහන් ගනු දෙනු සුළු මුදල් පොතක සටහන් කර අග්‍රිමය ප්‍රතිපූර්ණය කර දක්වන්න.
(විශේෂණ තීරු,ගමන් වියදම්, තැපැල් වියදම්, ලිපි ද්‍රව්‍ය හා විවිධ යනුවෙන් යොදා ගන්න)

2023.12.01ශේෂය	රුපියල් 270	
2023.12.01අග්‍රිමය මය ප්‍රතිපූර්ණ කරා	රුපියල් 2730	
2023.12.02 සංග්‍රහ වියදම්	රුපියල් 800	වවුචර් අංක 01
2023.12.03 ගමන් වියදම්	රුපියල් 600	වවුචර් අංක 02
2023.12.04 මුද්දර ගාස්තු	රුපියල් 200	වවුචර් අංක 03
2023.12.05 අතිකාරම් ගෙව්වා.	රුපියල් 800	වවුචර් අංක 04
2023.12.06 ලිපි ද්‍රව්‍ය ගත්තා	රුපියල් 400	වවුචර් අංක 05

(ල.04)

<u>ව්‍යාපාර හා ගිණුම්කරන අධ්‍යනය</u>

<u>2 වන වාර පරීක්ෂණය</u>

<u>පිලිතුරු පත්‍රය</u>

<u>1.</u>

i. (අ) නිවාස - ගෙවතු අලංකරණය
(ආ) * ගෙවතු අලංකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම .
* මූල්‍ය ශක්තිය තිබීම . (ල . 02)

ii. (අ) සේවා සැපයුම් ව්‍යාපාර
(ආ) ප්‍රාග්ධනය - * මුදල්
*ගොඩනැගිල්ල
* උපකරණ

ව්‍යවසායකත්වය - ගෙවතු අලංකරණ සැලසුම් කර ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ හැකියාව .

iii. (අ) * හවුල් ව්‍යාපාර
* ආරම්භ කිරීම පහසුවීම.
* හොද තීරණ ගත හැකිවීම .
* වගකීම බෙදී යාම .
* වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගැනීමට හැකිවීම .

(ආ) ලිඛිත ගිවිසුමක් මත ව්‍යාපාරය පවත්වා ගෙන යාම.

iv. (අ) ඔව් .
හවුල්කරුවන්ගේ සම්පූර්ණ නම් වලින් ව්‍යාපාරය පවත්වා ගෙන නොයන නිසා .

(ආ) * ව්‍යාපාරයට අනන්‍යතාවයන් ලැබීම.
* ව්‍යාපාරයේ නාමයේ අයිතිය තහවුරු වීම.
* ණය ලබා ගැනීමට පහසුවක් වීම.
* රජය මගින් දෙන දිරි දීමනා ලබා ගැනීමට පහසුවක් වීම.

v. මුදල් පොත
ලදුපත් වවුචරය

vi. වත්කම් = හිමිකම් + වගකීම
600000 = 400000 + 200000
හෝ

වත්කම්	=	හිමිකම් + වගකීම	
+ 100000	=	+ 100000	½
(මුදල්)			
+ 300000	=	+ 300000	½
(ගොඩනැගිලි)			
+ 200000	=	+ 200000	½
+200000(උපකරණ)			
-2000000(මුදල්)		(බැංකු ණය)	
600000	=	400000 + 200000	

vii.

මුදල් ගිණුම

1/1	ශේෂය	100000	1/1	උපකරණ ගිණුම	200000
	බැංකු ණය	200000		ගෑණුම් ගිණුම	16000
	මල් විකුණුම් ගිණුම	32000		මල් පොච්චි	22000
	සේවා ආදායම් ගිණුම	60000		මල් පැළ ගැනුම් ගිණුම	8000
	නමාලිගේ ගිණුම	200000		දුරකථන	2500
				මත්ස්‍යය ආහාර_	6000
			1/31	ශේෂය ගිණුම	337500
		592000			5920000

viii. **මුදල් ගිණුම හර** **200**000
බැංකු ණය ගිණුම 200000

ix. **ජංගම** වත්කම - මුදල් රු. 337500

ජංගම නොවන වත්කම - * ගොඩනැගිල්ල 300000
* උපකරණ 200000

x.

* දුරකථන වියදම් රු. 6000
* මල් පැළ අලෙවි ආදායම රු. 32000
* සේවා ආදායම් රු. 60000
* නිමාලි රැගෙන ආ ප්‍රාග්ධනය රු. 200000

2 පිලිතුර

i. (අ) * ලාභ ඉපයීම
* පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
(ල 1*2= 02)

ii. (අ) අසත්‍ය
(ආ) සත්‍ය
(ඉ) සත්‍ය
(ඊ) සත්‍ය
(ල ½ *4 = 2)

iii. (අ) සන්නිවේදනය - ස්මාර්ට් දුරකථනය (ල 01)
(ආ) බාහිර පරිසරය - තාක්ෂණික පරිසරය (ල 01)

iv. (අ) ශ්‍රමය - රංගිකාගේ ශ්‍රමය
භූමිය - ස්වභාවධර්මයෙන් ලබා ගන්නා ඖෂධීය කොටස්
ව්‍යවසායකත්වය - රංගාකා සතු ආපන ශාලාව පවත්වා ගෙන යාමේ ව්‍යාපාරික හැකියාව (ල ½ *2 = 01)

(ආ) අයිතිකරු - රංගිකා (ල 01)

ගනුදෙනුකරුවන් - * කාර්යාලයේ සේවකයින්

* ගුරුවරුන්

* විදුහල්පතිවරුන් (ල 01)

3 පිලිතුර

i. ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව ව්‍යාපාර පරිසරයයි. (ල 02)

ii. (අ) සත්‍ය
(ආ) අසත්‍ය
(ඉ) සත්‍ය
(ඊ) අසත්‍ය (ල ½ *4 = 2)

iii. (අ) තාක්ෂණික පරිසරය (ල 01)

(ආ)

හිතකර	අහිතකර
* කාලය ඉතුරුවීම	* වංචා ඇතිවීමට ඇති ඉඩකඩ
* පිරිවැය අලවිය	* විරැකියාව ඇති විය හැකි වීම (ල 01)

iv. (අ) සුවිශේෂී නිශ්පාදන ශිල්ප ක්‍රම යොදා ගැනීම
(ආ) විදේශීය රට වලින් අත්‍යාවශ්‍ය නොවනද ද්‍රව්‍ය ආනයනය තහනම් කිරීම (ල 02)

4 පිලිතුර

i. * අයිතිකරුගේ වගකීම අසීමිත වීම
* ප්‍රාග්ධනය රැස් කර ගැනීමේ දුෂ්කරතා
* අඛන්ඩ පැවැත්මක් නොමැති වීම
* නෛතික පුද්ගලභාවයන් නොමැති විය
* තනිව ගන්නා තීරණ අසාර්ථක වීම (ල 02)

ii. (අ) අසත්‍ය
(ආ) අසත්‍ය
(ඉ) අසත්‍ය
(ඊ) සත්‍ය (ල ½ *4 =2)

iii. (අ) සීමාසහිත දිවිතුරුවෙල වැවිලි සමාගම - පෞද්ගලික
මහජන බැංකුව - පොදු (ල 01)

(ආ) සීමාසහිත දිවිතුරුවෙල වැවිලි සමාගම - 2007 අංක දරණ සමාගම්
මහජන බැංකුව - විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින් (ල 01)

iv. * ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය
* ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය (ල 01)

5 පිලිතුර

i. * ව්‍යාපාරය කොපමණ ලාභයක් උපයා ඇත්ද යන්න බලා ගැනීම.
* ව්‍යාපාරයේ මූල්‍ය තත්වය දැන ගැනීම
* නීතිමය අයශ්‍යතා සපුරාලීම
* වංචා හා දූෂණ වැළැක්වීම (ල 02)

ii. වත්කම් , වගකීම් , හිමිකම් , ආදායම්, වියදම් (ල 02)

iii. **(අ)** ග.අ.

වත්කම් = හිමිකම් + වගකීම්

(අ) +50000(මුදල්)	=	+50000	+ -
(ආ) +15000(තොග)	=	-	+ -
- 15000(තොග)			
(ඇ)+25000(මුදල්)	=	-	+ 25000
(ඉ) -10000 (තොග)	=	+ 5000	+ -
+ 15000(ණයගැනි)			
(ඊ) – 3000(මුදල්)	=	- 3000	+ -
77000	=	52000	+ 25000

(ල 1*4 = 4)

(ආ) වත්කම් = හිමිකම් + වගකීම්
රු. 77000 = රු. 52000 + රු. 25000 (ල 02)

iv. (අ) රු. 100 000 තොග මිලදී ගැනීම
(ආ) රු. 50 00 ක ගැනිලි සිදු කිරීම / වියදමක් දැරීම
(ඉ) රු . 50 000 ක බැංකු ණය ගැනීම
(ඊ) රු. 10 000 ක ආදායම් ලැබීම / අමතර ප්‍රාග්ධනය සෙවීම

(ඉහතින් දක්වා ඇත්තේ උදා. පමණි . නවැරදි ගනුදෙනු සඳහා ලකුණු ලබා දෙන්න) (ල 02)

6 පිළිතුර

ගනුදෙනුව	මූලික සටහන් පොත	මූලාශ්‍ර ලේඛනය
A	මුදල් පොත	ලදුපත
B	ගෑණුම් ජනලය	ගෑණුම් ඉන්වොයිසිය
C	පොදු ජනලය	ජනල් වවුචරය
D	විකුණුම් ජනලය	විකුණුම් ඉන්වොයිසිය

(ල ½ * 8 = 4)

i. (අ) * අත්පිට ගනුදෙනු
* ණයට සිදුවන ගනුදෙනු (ල 01)

(ආ) * අත්පිට ගනුදෙනු = රු . 200 00 ක භාණ්ඩ තොගයක් මිලට ගැනීම .
* ණයට සිදුවන ගනුදෙනු = ජයරාණී ලී බඩු වෙළඳ සැලෙන් කාර්යාල පුටු දෙකක් ණයට ගැනීම .
(ල 01)

ii. (අ) ප්‍රාග්ධනය ගිණුම , මුදල් ගිණුම , ගැනිලි ගිණුම , විදුලි ගාස්තු ගිණුම
(ගිණුම් 4 ක් නිවරදිව දක්වා ඇත්නම්) (ල 02)

(ආ) වත්කම් ගිණුම් - මුදල් ගිණුම
හිමිකම් ගිණුම් - ප්‍රාග්ධනය ගිණුම , ගැනිලි ගිණුම
වියදම් ගිණුම් - විදුලි ගාස්තු ගිණුම (ල ½ *4 = 2)

iii. * ගං වතුර උවදුරෙන් රු. 25 000 ක භාණ්ඩ තොගයක් විනාශ වීම .
* ණය ගැනියෙකුගෙන් ලැබිය යුතු රු . 5000 ක ණය මුදලක් බොල් ණය ලෙස කපා හැරීම .

(සුදුසු නිවරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න) (ල 02)

Past Papers Wiki

7 පිලිතුර

i. (අ) නියමිත කාලය තුළ ණය බෙරුම් කරන විට ණය මුදලෙන් කරනු ලබන අඩු කිරීම මුදල් මට්ටමය .
(ල 01)

(ආ) දුන් වට්ටම් ගිණුම හර XX
ණය ගැති ගිණුම බැර XX (ල 01)

ii. කිසියම් කාලපරිච්ඡේදයක් තුළ සුළු මුදල් භාරකරු විසින් වියදම් කල මුදලට සමාන මුදලක් ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුව ලබාදීම අග්‍රිමය ප්‍රතිපූර්න්ය කිරීම ලෙස හදුනිවනු ලැබේ . (ල 02)

iii. මුදල් පොත

හර

දිනය	ලදුපත් අංකය	විස්තරය	ස.නි.අ.	වටිනාකම්	දිනය	ව	විස්තරය	ස.නි.අ.	වටිනාකම්
1/1		ශේෂය		24000	1/4	01	ගෑණුම් ගිණුම්		15 000
1/2	01	විකුණුම් ගිණුම		48000	1/5	02	විවිධ වියදම් ගිණුම්		6000
1/3	02	ලද කොමිස් ගිණුම		18000					
					1/31		ශේෂය ප/ගෙ		69000
				90 000					90 000

ආකෘතියට ල ½
ගනුදෙනු 5 සඳහන් නම් ½ * 5 = 2 ½
1/ 31 නිවැරදි ශේෂයට ල 01 යි .

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

iv. සුළු මුදල් පොත

ලැබීම්	ස.	දිනය	විස්තරය	ව.අ.	ගෙවීම්	විශ්ලේෂණ නි .				
						ග.වි.	පා.වි.	ලි.ද.	විවිධ	ලෙ.ගි.
270		12.01	ශේෂය							
2730		12.01	මුදල්							
		12.02	සංග්‍රහ වියදම්	01	800	-	-	-	800	
		12.03	ගමන් වියදම්	02	600	600	-	-	-	
		12.04	මුද්දර වියදම්	03	200	-	200	-	-	
		12.05	අත්තිකාරම්	04	800	-	--	-	-	400
		12.06	ලිපි ද්‍රව්‍ය	05	400	-	-	400	-	-
3000		12.07	ශේෂය ප/ගෙ		2800 200	600 (ල ½)	200 (ල ½)	400 (ල ½)	800 (ල ½)	400 (ල ½)
200 (ල ½)		12.08	ශේෂය ඉ/ගෙ		3000					
2800 (ල ½)		12.08	මුදල්							

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank